**ශීර්ෂය 182 - විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

---

**විගණන විෂය පථය**

---

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුලි 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 672.6 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 641.6 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම රු.මිලියන 31 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.61 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 468.3 | 454.7 | 13.6 | 2.90 |
| මූලධන | 204.3 | 186.9 | 17.4 | 8.52 |
| **එකතුව** | **672.6** | **641.6** | **31.0** | **4.61** |

### 2.2 අත්තිකාරම් ගිණුම

#### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18201 | 8 | 8 | 4.1 | 5.4 | 52 | 9.2 |

### 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 11.4 ක් විය.

### 2.4 පොදු තැන්පත්ගිණුම

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 0.1 ක් විය.

### 2.5 විගණන නිරීක්ෂණ

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන්

නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය 182 - විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 08 ක් සඳහා සළසා තිබුණු රු.2,950,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 71 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

මෝටර් වාහනයක් 2012 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් වන විටත් නිෂ්ක්‍රීයව පැවැතුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය සතු කැබ් රථයක් හිටපු අමාත්‍යවරයා විසින් මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වෙන 2006 වර්ෂයේදී රැගෙන යාමෙන් පසුව එහි අළුත්වැඩියාවන් සිදුකර තිබුණි. එම රථය නැවත විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයට භාරදිය නොහැකි බව 2014 ඔක්තෝබර් 20 දිනැති ලිපියෙන් දන්වා ඇති බව 2015 ජුලි 15 දිනැති විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපියෙන් විගණනය වෙත දන්වා තිබුණි. එම වාහනය මහාමාර්ග,වරාය හා නාවික අමාත්‍යාංශය වෙත 2015 අගෝස්තු මාසය වන වන විටත් පවරා දී නොතිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

---------------------------

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ එකකට වැඩි වර්ෂ 03 කට අඩු කාලයක සිට පැවත එන රු.539,110 ක බැරකම් හා වර්ෂ එකකට අඩු කාලයක සිට පැවැත එන රු.8,053,843 ක බැරකම් වශයෙන් එකතුව රු.8,592,953 ක බැරකම් පැවැතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විසර්ජන ගිණුමෙහි බැරකම් යටතේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ප්‍රතිපූර්ණය කළ යුතු ගුවන් ටිකට්පත් ගාස්තුව රු.504,260 ක් සඳහන් කර තිබුණි. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අමාත්‍යාංශයෙන් අයවිය යුතු මුදල ලෙස රු.615,700 ක් සඳහන් කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා කාර්යාංශයේ ගිණුම් අතර රු.111,440 ක වෙනසක් පැවැතුණි.

(ii) සංවර්ධන නිලධාරින්ගේ ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශය විසින් ගෙවන ලද රු.7,334,796 ක් විසර්ජන ගිණුමෙහි බැරකම් යටතේ පෙන්වා නොතිබුණි.

**3.3 අනුකූල නොවීම්**

-----------------

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 138 | 1,073,501 | අමාත්‍යාංශය විසින් 2014 ජනවාරි මාසයේ සිට අගෝස්තු දක්වා වාහන අළුත්වැඩියා වියදම් මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව අළුත්වැඩියාව නිවැරදිව සිදුකර ඇති බවට සෑහීමකට පත්වීමකින් තොරව ගෙවීම් සහතික කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 571 (3) | 146,480 | 2014 අගෝස්තු 21 දින පොදු තැන්පත් ගිණුමට UK City බැංකුව නමින් බැර කර තිබුණු රු.146,480 ක තැන්පතුව සම්බන්ධයෙන් 2015 මැයි 19 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>**---------------------------**<br>2007 සැප්තැම්බර් 11 දිනැති අංක 212/2007 දරන චක්‍රලේඛයේ 10.7 ඡේදය | | 2014 වර්ෂයේදී විදේශ රාජකාරි ගමන්වල නිරත වූ අමාත්‍යාංශ නිලධාරීන් 07 කට අදාල වාර්තාවල පිටපත් ලිපිගොනුවල ඇතුළත් කර නොතිබුණි. |
| **(ඇ)** | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**<br>**---------------------**<br>2011 නොවැම්බර් 15 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී 01/04/08 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපි අංක 01හි 2වන ඡේදයේ කාණ්ඩ අංක (V) | 102,519 | 2014 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් යථෝක්ත චක්‍රලේඛ නියමයන්ගෙන් බැහැරව නිලධාරීන් 04 දෙනෙකුගේ දූරකථන බිල්පත් ප්‍රතිපූර්ණය කර තිබුණි. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 08 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,213 | 1,023 | 190 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 26 | 19 | 07 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික /කොන්ත්‍රාත් පදනම) | 03 | - | 03 |
| | **එකතුව** | **1,253** | **1,052** | **201** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 201 පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.